# "නව යෞවනයන්ගේ ස්වසංකල්ප හා ඔවුන් සංජානනය කර ගත් ගුරුවරියා අතර පවත්නා සම්බන්ධතාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්"

(නාගරික වරප්‍රසාද අඩු පරිසරවල පිහිටි පාසල් ඇසුරිනි.)

කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන දර්ශනපති උපාධිය (M.Phil) සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධනය - 1998


අධ්‍යාපන පීඨය
කොළඹ විශ්වවිද්‍යාලය
ශ්‍රී ලංකාව
1998-06-04

ඒ.ජී. ශ්‍රිමති අමරසිංහ
සමාජවිද්‍යා ඩිප්ලෝමා
අධ්‍යාපනවේදී ගෞරව උපාධි
අධ්‍යාපනපති උපාධි
94/M.Phil/03



UCLIB
480861

# සංක්ෂේපයෙන්

ස්ව සංකල්පය සාමාන්‍ය පෞරුෂයේ ම කොටසකි. පරිසරය සමග සිදුවන අන්තර ක්‍රියාකාරිත්වය තුළින් එහි වර්ධනය සිදුවේ. එබැවින් ස්ව සංකල්පය ජීවවිද්‍යාත්මක සාධකවලට වඩා සමාජ මනෝවිද්‍යාත්මක සාධක ඇසුරෙන් ගොඩනැගෙන බව සඳහන් කළ හැකිය. පුද්ගලයා එදිනෙදා සම්බන්ධකම් පවත්වන වැදගත් අනෙක් අය, එනම් දෙමව්පියන්, ගුරුවරුන් හා සම වයස් කණ්ඩායම් වෙතින් ලබන ඇගයුම් වැදගත් වේ.

පාසල ළමයාගේ කුසලතා වර්ධනයට සහාය වේ. මෙහි දී ළමයාව ඇගයීමට ලක් කෙරෙන අතර, අන් අය හා ඇගයීමට ද අවස්ථාව ලැබේ. ඉහළ ලකුණු ලබන්නන් ගුරුවරයාගේ ධනාත්මක ඇගයුමටත්, අවම ලකුණු ලබන්නන් ගුරුවරයාගේ ඍණාත්මක ඇගයුමටත් ලක්වේ. අසමත් වුවත් ගුරුවරයාගේ ඇගයුම් පරිමාණයේ පහල තලයටම වැටේ. ළමයාගේ ස්ව සංකල්ප වර්ධනය කිරීමේ දී මෙම අවස්ථාව වැදගත් වේ. ශිෂ්‍යයා ලබන සාධන ලකුණු මත, දුර්වල, සාමාන්‍ය, ඉහළ මට්ටමේ යන අර්ථයන් සහිතව ගුරුවරයා විසින් ශිෂ්‍යයා තුළ ස්ව සංකල්ප ඇති කරනු ලබයි. මෙහි දී ගුරුවරයා ශිෂ්‍ය ගැටලු හා අවශ්‍යතා පිළිබඳ සියුම් අවබෝධයක් ඇත්තෙකු විය යුතුයි. සෑම ශිෂ්‍යයෙකුගේ ම දක්ෂතා මතු කෙරෙන අවස්ථා ගුරුවරයා තෝරා බේරා ගත යුතුයි. ශිෂ්‍යයාගේ සාර්ථකත්වයට සරිලන සේ උපස්ථම්භන දීම ස්ව සංකල්ප වර්ධනයට හේතු වේ.

අද්‍යතන අධ්‍යයනය මගින් වරප්‍රසාද අඩු නාගරික පරිසරවල පිහිටි පාසල්වල ඉගෙනුම ලබන නව යෞවනයන්ගේ ස්ව සංකල්ප සංජානනය හා ඔවුන් සංජානනය කර ගන්නා ලද ගුරු චර්යා අතර සහසම්බන්ධතාව විමර්ශනයට අපේක්ෂා කෙරේ. එහි දී නව යෞවනයන්ගේ ස්ව සංකල්ප සංජානනය, පවුල හා එහි අන්තර් ක්‍රියාකාරිත්වය පිළිබඳ ස්ව සංකල්පය, පාසල හා ඉන් ලබන වින්දනය පිළිබඳ ස්ව සංකල්පය, චිත්තවේග ස්ථාවරත්වය පිළිබඳ ස්ව සංකල්පය, සම වයස් කණ්ඩායම් පිළිබඳ ස්ව සංකල්පය, කායික පෙනුම පිළිබඳ ස්ව සංකල්පය

යන උප පරිමාණ 5 යටතේ පරීක්ෂාවට ලක් කෙරේ. නව යොවනයන්ගේ ගුරු වර්යා පිළිබඳ සංජානනය, ගුරුවරයාගේ සහයෝගය, අපේක්ෂණ, සහභාගිත්වය යන උප පරිමාණ 3 යටතේ පරීක්ෂාවට ලක් කෙරේ. අවසානයේ දී නව යොවනයන් සංජානනය කර ගන්නා ලද ස්ව සංකල්ප හා ගුරු වර්යා අතර සම්බන්ධතාව විමසා බැලේ.

අධ්‍යයනයේ 1.0 පරිච්ඡේදය ස්ව සංකල්පයේ පසුබිම හා වැදගත්කම විමසීම සඳහා යොදා ගැනේ. ස්ව සංකල්පය කෙරෙහි බලපාන සමාජ මනෝ විද්‍යාත්මක සාධක කෙරේ අවධානය යොමු කෙරේ. ළමයාගේ මුල්කාලීන පවුල් පරිසරය, නිවස් පරිසරය, පාසල් පරිසරය, චිත්තවේග ස්ථාවරත්වය, සම වයස් කණ්ඩායම්, කායික පෙණුම ආදි විචල්‍යයන් හා ස්ව සංකල්පය අතර පවත්නා සුවිශේෂ වැදගත්කම සාකච්ඡාවට භාජන කෙරේ. අධ්‍යයනය සඳහා වරප්‍රසාද අඩු ජන කණ්ඩායම්වලින් පාසලට පැමිණෙන ළමයින් යොදා ගන්නා හෙයින් වරප්‍රසාද අඩු ජන කණ්ඩායම්වල ස්ව සංකල්ප පිළිබඳ ව ද අවධාරණය කරන ලදි.

අධ්‍යයනයේ 2.0 පරිච්ඡේදය පෙර සාහිත්‍ය විමර්ශනය සඳහා වෙන් වේ. මෙහි දී ස්ව සංකල්පය හා ගුරු වර්යා පිළිබඳ ශිෂ්‍ය සංජානනය සම්බන්ධව කරන ලද අතීත අධ්‍යයනයන් විමසා බැලීම සිදු කෙරේ.

අධ්‍යයනයේ 3.0 පරිච්ඡේදය වර්තමාන පර්යේෂණ සැලැස්ම හා එය ක්‍රියාත්මක කළ ආකාරය සඳහන් කර ඇත. අධ්‍යයනය කොළඹ මහ නගර සභාවට සීමා කරන ලදි. පාසල් තියැදි, ශිෂ්‍ය තියැදි තෝරා ගැනීමේ දී අධ්‍යයන අමාත්‍යාංශයේ සහ නාගරික සංවර්ධන අධිකාරියේ සහාය ලබා ගන්නා ලදි. කොළඹ නගරයේ අඩු ආදායම් ලාභී නිවාස බහුල වශයෙන් ව්‍යාප්ත වූ, වරප්‍රසාද අඩු පරිසරවල පිහිටි, 2 සහ 3 වර්ගයේ මිශ්‍ර පාසල් 11 ක් මැතිවරණ කොට්ඨාශ පදනම් කරගෙන අහඹුව තෝරාගෙන ඇත. ගුරු ශිෂ්‍ය අන්තර් ක්‍රියාකාරිත්වය බහුලව සිදුවන අවධිය සහ නව යොවුන් විය වඩාත් හොඳින් නියෝජනය වීම යන කරුණු සලකා, 8 වසර ඉගෙනුම ලබන ගැහැණු

ළමයින් 150 ක් සහ පිරිමි ළමයින් 150 අහඹුව පොකුරු තියැදිය අනුගමනය කරමින් තෝරාගෙන ඇත. නව යෞවනයන්ගේ ස්ව සංකල්ප සංජානනය ධනාත්මක හෝ ඍණාත්මක මට්ටමක පවතී දැයි පරීක්ෂා කිරීම, ගැහැණු පිරිමි වශයෙන් ස්ව සංකල්ප සංජානනයේ වෙනසක් පවතී දැයි පරීක්ෂා කිරීම, නව යෞවනයන්ගේ ගුරු චර්යා පිළිබඳ සංජානනය ධනාත්මක හෝ ඍණාත්මක මට්ටමක පවතී දැයි පරීක්ෂා කිරීම, අවසානයේ දී නව යෞවනයන්ගේ ස්ව සංකල්ප සංජානනය හා ගුරු චර්යා සංජානනය අතර සහසම්බන්ධතාවක් පවතී ද, එහි ස්වභාවය කෙබඳු ද යන්න පරීක්ෂා කිරීම යන අරමුණු මෙම අධ්‍යයනය පදනම් කර ගන්නා ලදි. නව යෞවනයන්ගේ ස්ව සංකල්ප හා ගුරු චර්යා සංජානනය පරීක්ෂා කිරීම සඳහා ලයිකට් පරිමාණයේ මිනුම් උපකරණ 2 ක් සහ ස්වයං වාර්තා භාවිතා කරන ලදි. ස්ව සංකල්ප මිනුම් උපකරණය උප පරිමාණ 5 යටතේ සකස් කරන ලදි. එය පරීක්ෂණාංග 60 කින් සමන්විත විය. ගුරු චර්යා සංජානන මිනුම් උපකරණය උප පරිමාණ 3 යටතේ සකස් කරන ලද අතර, එහි පරීක්ෂණාංග 140 ක් අඩංගු කරන ලදි. ඉහත සඳහන් කරන ලද මිනුම් උපකරණවල ධනාත්මක මෙන්ම ඍණාත්මක පරීක්ෂණාංග අඩංගු කරන ලදි. ධනාත්මක පරීක්ෂණාංග සඳහා 4,3,2,1 වශයෙන් ලකුණු ලැබෙන පරිදිත්, ඍණාත්මක පරීක්ෂණාංග සඳහා 1,2,3,4 වශයෙන් ලකුණු ලැබෙන පරිදිත් ලකුණු ප්‍රදානය කරනු ලැබින. පරීක්ෂණාංග සඳහා ලැබෙන ලකුණුවල එකතුව ශිෂ්‍යයාගේ ස්ව සංකල්ප සංජානනය හා ගුරු චර්යා සංජානනය පිළිබඳ ලද මිනුමක් ලෙසට සලකන ලදි. එසේ සකස් කර ගන්නා ලද මිනුම් උපකරණ නියාමක පරීක්ෂණයකට භාජන කරන ලදි. එහි දී හඳුනා ගන්නා ලද ප්‍රබලතා හා දුබලතා අනුව ස්ව සංකල්ප මිනුම් උපකරණය පරීක්ෂණාංග 50 දක්වාත්, ගුරු චර්යා සංජානන මිනුම් උපකරණය පරීක්ෂණාංග 60 දක්වාත් වන සේ නැවත සකස් කරන ලදි. කොළඹ නගරයේ සියලුම ඡන්ද කොට්ඨාශ නියෝජනය වන සේ තෝරා ගන්නා ලද පාසල්වල විදුහල්පතිවරු සමග සාකච්ඡා කොට දින නියම කර ගන්නා ලදි. දත්ත රැස් කිරීම පර්යේෂකයා විසින් ම සිදු කරන ලද අතර, 1997.06.06 දින ආරම්භ කරන ලදි. මිනුම් උපකරණ සඳහා ප්‍රතිචාර ලබා ගැනීමත්, ස්වයං වාර්තා, ලබා ගැනීමත් අදාළ දිනවල දී ම සිදු කරන ලදි.

අධ්‍යයනයේ 4.0 පරිච්ඡේදය දත්ත ඉදිරිපත් කිරීම සහ දත්ත විශ්ලේෂණය සඳහා වෙන් කරන ලදි. සංඛ්‍යාවිද්‍යාත්මක ක්‍රම සහ විස්තරාත්මක සංඛ්‍යාන විධි විශ්ලේෂණය සඳහා භාවිතා කරන ලදි. මධ්‍යනය, සම්මත අපගමනය සහ කල්පිත පරීක්ෂාවන් ඇසුරින් දත්ත විශ්ලේෂණය කරනු ලැබූ අතර ස්වයං වාර්තා විශ්ලේෂණය සඳහා විස්තරාත්මක සංඛ්‍යාන විධි උපයෝගී කර ගන්නා ලදි. ගුරුවරයාගේ දිරිගැන්වීමේ ක්‍රියාවලිය, ප්‍රශ්න විචාරය, විෂය කරුණු සන්නිවේදනය, විෂය කරුණුවල දැනුවත්භාවය, ශිෂ්‍ය ක්‍රියාකාරකම් ඇගයීම, අඩුවම් ක්‍රියාත්මක කිරීම, කැපවීමේ ස්වභාවය හා ගුරුවරයාගේ හැසිරීම් රටා පිළිබඳ ශිෂ්‍යයන් තුළ පවතින සංජානනය, විස්තරාත්මක සංඛ්‍යාන විධි ආශ්‍රයෙන් විශ්ලේෂණය කරන ලදි. අවසානයේ දී නව යෞවනයන්ගේ ස්ව සංකල්ප සංජානනය හා ගුරුවරයා සංජානනය අතර සහසම්බන්ධතාව පියර්සන් ගුණිත ඝූර්ණ සහසම්බන්ධන සංගුණකය ඇසුරින් පරීක්ෂාවට ලක් කරන ලදි.

අධ්‍යයනයේ 5.0 පරිච්ඡේදය දත්ත අර්ථකථනය හා අනාවරණ සඳහා වෙන් වේ. එහි දී ස්ව සංකල්පය හා ශිෂ්‍යයා ජීවත්වන පරිසරය, ස්ව සංකල්ප යා වැදගත්වන අනෙක් අය, පවුල පිළිබඳ ස්ව සංකල්පය, පාසල පිළිබඳ ස්ව සංකල්පය, චිත්තවේග ස්ථාවරත්වය පිළිබඳ ස්ව සංකල්පය, සම වයස් කණ්ඩායම් පිළිබඳ ස්ව සංකල්පය, කායික පෙනුම පිළිබඳ ස්ව සංකල්පය යනාදිය සාකච්ඡාවට ලක් කරන ලදි.

අධ්‍යයනයේ 6.0 යටතේ නිගමන හා යෝජනා ඉදිරිපත් කර ඇත. කොළඹ නගරයේ වරප්‍රසාද අඩු නාගරික පරිසරවල පිහිටි පාසල්වල ඉගෙනුම ලබන නව යෞවනයන්ගේ ස්ව සංකල්ප සංජානනය විමසීමේ දී පවුල, පාසල, චිත්තවේග ස්ථාවරත්වය, සම වයස් කණ්ඩායම් හා කායික පෙනුම ධනාත්මකව සංජානනය කරන බව පෙනේ. එසේ ම සම වයස් කණ්ඩායම් ඉහළ මට්ටමින් ධනාත්මකව සංජානනය කරන අතර පවුල, පාසල, චිත්තවේග ස්ථාවරත්වය, කායික පෙනුම ඉහළ මට්ටමින් ධනාත්මකව සංජානනය නොකරන බව ද පෙනේ. ගැහැණු පිරිමි බව අනුව නව යෞවනයන් කායික පෙනුම සංජානනය කරන ආකාරයේ

University of Colombo
Library
Sri Lanka

විෂමතා පවතී. එහෙත් පවුල, පාසල චිත්තවේග ස්ථාවරත්වය, සම වයස් කණ්ඩායම් පිළිබඳ සංජානනය ගැහැණු පිරිමි බව අනුව වෙසෙසි වෙනසක් නොපවතී.

වරප්‍රසාද අඩු නාගරික පරිසරවල ශිෂ්‍යයෝ, දෙමාපිය සැලකිලි ඍණාත්මකව සංජානනය කරති. දෙමාපියන්ගෙන් බහුතරය නූගතුන් වීම, රැකියා සඳහා විදේශගත වීම, මව පියා වෙන්වීම වැනි සාධක හේතු කරගෙන දෙමාපිය අවධානය හා රැකවරණය නොලබන නව යෞවනයන් තුළ පවුල පිළිබඳ ඉහළ ධනාත්මක මට්ටමේ සංජානනයක් නැත. දෙමාපියන්ගෙන් ස්ව සංකල්ප වර්ධනය සඳහා ලැබෙන දායකත්වය ප්‍රමාණවත් නැත. නිවසට සාපේක්ෂව පාසල ජනප්‍රිය ස්ථානයක් ලෙසට හඳුනාගෙන ඇත. පාසලේ වැඩි කාලයක් රැඳී සිටීමේ ප්‍රවණතාවක් ඇත. විෂය හැකියාව පිළිබඳ ඉහළ මට්ටමේ සංජානනයක් නව යෞවනයන් තුළ නැත. "ඉගෙනීමේ අසාර්ථකයෙකි" යන ආකල්පය බොහෝ දෙනා තුළ පවතී.

චිත්තවේග ස්ථාවරත්වය පිළිබඳ ඉහළ මට්ටමේ සංජානනයක් නව යෞවනයින් තුළ නොපවතී. දෙමාපිය - දරු සබඳතාව ඍණාත්මක මට්ටමක පවතී. නව යෞවන වියේ ඇතිවන කැළඹිලි සහිත බව, අස්ථාවර බව, අසමතුලිත බව යන ලක්ෂණ ශිෂ්‍ය ස්වයං වාර්තා තුළින් වඩාත් මතුවී පෙනුණි. නිදහස් නිවහල් පුද්ගලයෙකු ලෙස පිළිගැනීම ඔවුන්ගේ අවශ්‍යතාවක් විය.

සම වයස් කණ්ඩායම් පිළිබඳ ඉහළ මට්ටමේ ධනාත්මක සංජානනයක් නව යෞවනයන් තුළ පවතී. මෙය ස්ව සංකල්ප වර්ධනයට හේතු වේ. කායික පෙනුම පිළිබඳ පිරිමි ළමයින්ට සාපේක්ෂව ගැහැණු ළමයින් තුළින් සංවේදී බවක් පිළිබිඹු වේ.

කොළඹ නගරයේ වරප්‍රසාද අඩු නාගරික පරිසරවල ඉගෙනුම ලබන නව යෞවනයන් තුළ ගුරු චර්යාව පිළිබඳ එනම් ගුරුවරයාගේ සහයෝගය, අපේක්ෂණ, සහභාගිත්වය සම්බන්ධයෙන් ඉහළ මට්ටමේ ධනාත්මක සංජානනයක් නැත. එසේ ම ගැහැණු පිරිමි බව අනුව නව යෞවනයන්ගේ ගුරුවරයාගේ චර්යාව පිළිබඳ සංජානනයේ වෙසෙසි වෙනසක් පවතී.

වරප්‍රසාද අඩු නාගරික පරිසරවල ඉගෙනුම ලබන නව යෞවන-යන්, සංජානනය කර ගන්නා ලද ගුරු සැලකිලිවල ස්වභාවය පහත සඳහන් කර ඇත. ගුරු සැලකිලි විශේෂයෙන් ම විෂය හැකියා මට්ටම මත පදනම් වී ඇත. ඉහළ සාධන ශිෂ්‍යයින් නිරන්තරයෙන්ම ගුරුවරයාගේ අවධානයට බඳුන් වේ. ගුරුවරු ප්‍රශ්න විචාරයේ දී ඉහළ සාධන සිසුන් ඉලක්ක කර ගනිති. ගුරුවරු ඉහළ සාධන මට්ටමේ සිසුන් සමග බහුලව අන්තර්ක්‍රියා කරති. කඩවසම් සහ දක්ෂ ළමයින් සම්බන්ධයෙන් ගුරුවරයාගේ දිරිගැන්වීමේ ක්‍රියාවලිය බොහෝ විට ක්‍රියාත්මක වේ. ගුරුවරයාගේ විෂය කරුණු සන්නිවේදනයේ ද දුර්වලතා පවතින බවට ද සංජානනය කරගෙන තිබුණි. ගුරුවරුන් දෙන දඬුවම් අසාධාරණ බවට සංජානනය කර තිබුණි. වයසට නොගැලපෙන දැඩි දඬුවම් ශිෂ්‍යයෝ එකහෙලාම ප්‍රතික්ෂේප කර තිබුණි. ඉහළ සාධන මට්ටමේ ශිෂ්‍යයන් ගුරුවරයාගේ තේරීම් අවස්ථාවන්ට ලක් වූයේ කලාතුරකිනි. ඉහළ හා පහළ සාධන ශිෂ්‍යයන්ට ගුරු-වරයාගෙන් ලැබෙන ප්‍රශංසාවේ ද විෂමතා දක්නට ලැබුණි. නව යෞවනයන් දයාව, කරුණාව, සෙනෙහස හා සදාචාරාත්මක වූ හැසිරීමක් ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරේ.

වරප්‍රසාද අඩු නාගරික පරිසරවල ඉගෙනුම ලබන නව යෞවන-යන්ගේ ස්ව සංකල්ප සංජානනය හා ගුරු චර්යා පිළිබඳ සංජානනය අතර සහ-සම්බන්ධතාව පිරික්සීමේ දී මතු කර ගන්නා ලද අනාවරණ ඇසුරින් බැස ගත් නිගමන පහත සඳහන් කෙරේ. නව යෞවනයන්ගේ ස්ව සංකල්ප හා ගුරු චර්යා සංජානනය අතර ධනාත්මක සහසම්බන්ධතාවක් පවතී. ඒ අතර නව යෞවනයන්ගේ පවුල හා එහි අන්තර් ක්‍රියාකාරිත්වය පිළිබඳ සංජානනය හා ගුරුවරයාගේ සහ-යෝගය හා සහභාගිත්වය අතර ඉහළ මට්ටමේ ධනාත්මක සහසම්බන්ධතාවක් ඇත. නව යෞවනයන්ගේ පාසල හා ඉන් ලබන වින්දනය පිළිබඳ සංජානනයත්, ගුරු-වරයාගේ සහයෝගය, අපේක්ෂණ පිළිබඳ සංජානනය අතරත් ඉහළ මට්ටමේ ධනාත්මක සහසම්බන්ධතාවක් ඇත. නව යෞවනයන්ගේ චිත්තවේග ස්ථාවරත්වය පිළිබඳ සංජානනයත්, ගුරුවරයාගේ අපේක්ෂණ පිළිබඳ සංජානනය අතරත් ඉහළ මට්ටමේ ධනාත්මක සහසම්බන්ධතාවක් ඇත. නව යෞවනයන්ගේ කායික පෙනුම

පිළිබඳ සංජානනයත්, ගුරුවරයාගේ අපේක්ෂණ පිළිබඳ සංජානනයත් අතර ඉහළ මට්ටමේ ධනාත්මක සහසම්බන්ධතාවක් පවතී. එසේ ම නව යෞවනයන්ගේ සම වයස් කණ්ඩායම් පිළිබඳ සංජානනයත්, ගුරු චර්යා සංජානනයත් අතර ධනාත්මක සහසම්බන්ධතාවක් පැවතුනත් එය ඉහළ මට්ටමේ ධනාත්මක සහසම්බන්ධතාවක් නොවේ.

ස්ව සංකල්පය පුද්ගලයා හා බැඳී පවතී. එමගින් පුද්ගලයාගේ පෞරුෂය තීරණය කෙරේ. එබැවින් ස්ව සංකල්පය අවම මට්ටමට යා නොදී රැක ගැනීම අවශ්‍ය වේ. මෙහි දී පුද්ගලයාට වැදගත් වන අනෙක් අය අතර දෙමව්පියන් හා ගුරුවරු ප්‍රබල වේ. එයිනිදු ගුරුවරයා, සුවිශේෂ වේ. ශිෂ්‍යයා හා ගුරුවරයා අතර සිදුවන අන්තර් ක්‍රියාකාරිත්වයේ ස්වභාවය, ශිෂ්‍යයාගේ ස්ව සංකල්පය හැඩ ගැස්වීමට, වර්ධනයට හෝ පිරිහීමට හේතු වේ.

88888888888888888888888888